# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 44 — 1973 ජනවාරි 26 වැනි සිකුරාද — 1973.01.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II අ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 83 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 95 |

සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපල උපරිමය පිළිබඳ පනත 1973 ජනවාරි මස 26 දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

# තනතුරු-ඇබෑර්තු

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අත්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවුවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

## සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාද වී ලැබෙන දන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. තෝරාගනු ලැබූ අයදුම්කරු රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම ප්‍රථමයෙන් තුන් අවුරුදු පරිවාස කාල සීමාවකට යටත්වෙනු ඇත.

**සටහන :**

(i) **1971.12.31** දින රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දැරූ යම්කිසි පුද්ගලයෙකු පත් කලහොත් නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීමට ඔහුට හැකිවෙනු ඇත.

(ii) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරන රජයේ සේවකයෙකු තෝරාගනු ලැබුවහොත් පළමුකොට ඔහුගේ පත්වීම නියමිත කාලයක් සඳහා වැඩබැලීමේ පදනමක් මත වනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේය.—අවුරුද්දට රු. 7,440 න් පටන් ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වර්ධක 10 කින් හා රු. 480 බැගින් වූ වාර්ෂික වර්ධක 7 කින් අවුරුද්දකට රු. 14,400 දක්වා වැඩිවේ. රු. 11,520 වාර්ෂික වැටුප් ලක්ෂ්‍යයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සහිතයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) **1973** පෙබරවාරි **28** වැනි දිනට වයස අවුරුදු **25** නොඅඩු හා අවුරුදු **45** ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ යෙදී සිටින්නවුන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන හෝ උසස් විභාගයකින් සමත්ව ඇති බව, සහ

(ii) (අ) මි.මි. 16 සහ මි.මි. 35 චිත්‍රපට නිෂ්පාදනය කිරීම, වාර්තා චිත්‍රපට, ප්‍රවෘත්ති චිත්‍රපට හා කෙටි චිත්‍රපට අධ්‍යක්ෂණය කිරීම ආදී චිත්‍රපට සම්බන්ධ සියළුම කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 6 ක මනා පළපුරුද්දක් තිබීම.

(ආ) ඡායාරූප ශිල්පය, සකස්කිරීම, මුද්‍රණය, සංස්කරණය හා ශබ්ද පාලනය ආදී චිත්‍රපට කලාවට අදාල සියලුම කරුණු සම්බන්ධ විශිෂ්ඨ දැනීමක් තිබීම සහ චිත්‍රපට නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ පරිහරණය කිරීමේ පළපුරුද්දක් තිබීම.

(ඇ) චිත්‍රපට කලාවට ඇතුලත් ඉහත සඳහන් අංශයන් කීපයක් හෝ එකක් සඳහා පිළිගත් දේශීය හෝ විදේශීය සංවිධානවලින් පිරිනමනු ලබන සම්මාන හිමිකරුවෙක් බව.

**සැලකිය යුතුය :**

**ඉහත 4 ඇ (ii) "අ" සහ "ආ" ඡේදයන්හි දැක්වෙන සුදුසුකම් තිබේ නම් චිත්‍රපට අංශයේ චිත්‍රපට අධ්‍යක්ෂකවරුන් සහ අංශ ප්‍රධානීන් ඔවුන්ගේ තනතුරුවලට ස්ථිර කර ඇත්නම්, ඉහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් නොතකා ඔවුන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.**

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) **වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.**

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. (i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත අනෙක් ලියකියවිලි සියල්ලක් ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ.බ. ලේකම් නැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුන බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එන්. පී. විජයරත්න,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ
වැ. බ. ලේකම්.

**1973** ජනවාරි **13** වන දින,
කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශ කාර්යාලයේදීය.

ආදර්ශ ආකෘති පත්‍රය

**ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය**

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශයේ නිෂ්පාදක (වාර්තා චිත්‍රපට) තනතුර

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) තැපැල් ලිපිනය :————.

(3) උපන් දිනය :— වර්ෂය :——, මාසය :——, දිනය :——.

(4) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට නියම වයස :— අවුරුදු :————, මාස :————, දින :————.

(5) ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද ? යන බව සඳහන් කරන්න :————.

(6) උපන් ස්ථානය :——

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

(7) (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹුවෙක් ද ? වැන්දඹුවක ද ? යන වග :————.

(8) සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :————.

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

(9) වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල සහ වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | වෘත්තීය අධ්‍යාපනය | |
|---|---|---|---|
| (1) | ........................ | (1) | ........................ |
| (2) | ........................ | (2) | ........................ |
| (3) | ........................ | (3) | ........................ |
| (4) | ........................ | (4) | ........................ |
| (5) | ........................ | (5) | ........................ |

(10) ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ටත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

(11) (අ) ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණද? :————.

(ආ) ඔබ සැපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකයන් සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

(12) අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල, විස්තර සහ ඒවා ලබා ගන්නා ලද ආයතනවල නම් :————.

(13) දැනට නිරත රක්ෂාව හා ඊට පෙර කරන ලද රක්ෂාවල් : පදවිය :————, සිට :————, දක්වා :————.

වාර්ෂික වැටුප :————.

(රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න).

සැ : යු : රජය යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහත 15 වැනි කොටුවේ සඳහන් කළ යුතුය.

(14) විශේෂ සුදුසුකම් : දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේ ද? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

(15) තවත් තොරතුරු කිසිවක් ඇත්නම් ඒවා :————.

(16) මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකුවීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :————.

1–916—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

### පුලිමුඩෙයි ඉල්මනයිට් යන්ත්‍රාගාරය

### පාලන සහකාර තනතුර

මෙම සංයුක්ත මණ්ඩලයේ පුලිමුඩේ, ඉල්මනයිට් යන්ත්‍රාගාරයේ පාලන සහායක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් :

1. අවුරුදු පහක විධායක පළපුරුද්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් තිබීම

හෝ

අවුරුදු දහයක පළපුරුද්ද සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය හෝ ඊට සමාන සහතිකයක් තිබීම. (මෙම අවුරුදු දහයෙන් හතක්, පිළිගත් ආයතනයෙක පරිපාලන හෝ විධායක තත්ත්වයේ විය යුතුය.)

2. ගිණුම් කටයුතු පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් හා පළපුරුද්දක් තිබීම.

වැටුප්.—රු. 800—45—රු. 1,115. සියල්ල අන්තර්ගත මාසික වැටුපක් ලැබේ.

වයස, අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර සඳහන් අයදුම් පත්, සහතික පත්‍රවල පිටපත් සමග අමුණා, කොළඹ, තැ. පෙ. 1212, ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත 1973 පෙබරවාරි 10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලයන්හි සේවයේ නියුක්ත නිලධරයන්ගේ අයදුම්පත්, ස්වකීය දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලයන්හි ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

එස්. ඉගලගේවා,
ලේකම්/පිරිස් කළමනාකරු,
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

සෝඉ : ප්‍රාවී : ඇස්කෝ.
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය,
167, ශ්‍රී විපුලසේන මාවත,
තැ. පෙ. 1212,
කොළඹ 10. 1973.01.08.

1–998—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශයේ ප්‍රධාන නිෂ්පාදක තනතුර

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශයේ ප්‍රධාන නිෂ්පාදක තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවර " ප්‍රධාන නිෂ්පාදක " යනුවෙන් සඳහන් කළ යුතුය.

(අ) මෙරට ඉල්ලුම්පත් 1973 පෙබරවාරි 28 වැනිදා

(ආ) විදේශීය ඉල්ලුම් පත් 1973 මාර්තු 07 වැනිදා.

සටහන :—(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු ය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. තෝරාගනු ලැබූ අයදුම්කරු රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. ඔහුගේ පත්වීම ප්‍රථමයෙන් තුන් අවුරුදු පරිවාස කාල සීමාවකට යටත් වනු ඇත.

සටහන :—(i) 1971.12.31 දින රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දැරූ යම්කිසි පුද්ගලයෙකු පත් කළ හොත් නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීමට ඔහුට හැකිවනු ඇත.

(ii) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරණ රජයේ සේවකයෙකු තෝරාගනු ලැබුවහොත් පළමුකොට ඔහුගේ පත්වීම නියමිත කාලයක් සඳහා වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

3. වැටුප සහ දීමනා.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේ ය. අවුරුද්දට රු. 11,040 න් පටන්ගෙන රු. 480 බැගින් වූ වාර්ෂික වර්ධක 11 ක් මගින් අවුරුද්දකට රු. 16,320 දක්වා වැඩිවේ. (රු. 13,920 දී දෙවෙනියක නැවතීමක් හා රු. 14,400 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද සහිත වේ).

සටහන.—තෝරාගනු ලබන අපේක්ෂකයා සතු සුදුසුකම් හා පළපුරුද්ද අනුග්‍රහයට තරම් වේ නම් භාණ්ඩාගාරයේ ද අනුමැතිය ඇතිව, වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක ඔහු තබනු ලැබේ. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අපේක්ෂකයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ වැටුප ආයතන සංග්‍රහයේ 7 වෙනි පරිච්ඡේදය අනුව නිශ්චය කරනවා ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1973 පෙබරවාරි 28 වෙනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව (දැනට රජයේ සේවයෙ යෙදී සිටින්නවුන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත).

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන හෝ උසස් විභාගයකින් සමත්ව ඇති බව.

සහ,

(ii) (අ) මි. මී. 16 සහ මි. මී. 35 චිත්‍රපට නිෂ්පාදනය කිරීම, වාර්තා චිත්‍රපට, ප්‍රවෘත්ති චිත්‍රපට හා කෙටි චිත්‍රපට අධ්‍යක්ෂණය කිරීම ආදි චිත්‍රපට සම්බන්ධ සියලුම කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 8 ක මනා පළපුරුද්දක් තිබීම.

(ආ) ඡායාරූප ශිල්පය, සකස් කිරීම, මුද්‍රණය, සංස්කරණය හා ශබ්ද පාලනය ආදී චිත්‍රපට කලාවට අදාල සියලුම කරුණු සම්බන්ධ විශිෂ්ඨ දැනීමක් සහ චිත්‍රපට නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ පරිහරණය කිරීමේ පළපුරුද්දක් තිබීම.

(ඇ) චිත්‍රපට කලාවට ඇතුළත් ඉහත සඳහන් අංශයන් කීපයක් හෝ එකක් සඳහා පිළිගත් දේශීය හෝ විදේශීය සංවිධානවලින් පිරිනමනු ලබන සම්මාන හිමිකරුවෙක් බව.

**සටහන :** ඉහත 4(ඇ)(II) ඡේදයේ දැක්වෙන සුදුසුකම් තිබේ නම් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන නැතහොත් උසස් අධ්‍යාපනික සුදුසුකම් දරණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් ද අයදුම්පත් භාරගන්නවා ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(I) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය

(II) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවූන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත අනෙක් ලියකියවිලි සියල්ලක්ම ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ (I) වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුන බවට දැන්වීමක් නොලැබෙන්නා වූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එන්. ජී. විජයරත්න,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයෙ
වැ. බ. ලේකම්.

1973 ජනවාරි 13 දින,
කොළඹ 1
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

ආදර්ශ ආකෘති පත්‍රය

**ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය**

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශයේ ප්‍රධාන නිෂ්පාදන තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය : වර්ෂය :——, මාසය :——, දිනය :——.

4. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට නියම වයස : අවුරුදු :——, මාස :——, දින :——.

5. ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක්ද, එසේ නැතහොත් ලියාපදිංචිවූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න :————.

6. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

7. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවකද යන වග :————.

8. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

9. වයස 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | වෘත්තීය අධ්‍යාපනය |
|---|---|
| (1) :————. | (1) :————. |
| (2) :———— | (2) :————. |
| (3) :————. | (3) :————. |
| (4) :————. | (4) :————. |
| (5) :————. | (5) :————. |

10. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

11. (අ) ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේද ? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණද ?

(ආ) ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක්ද ? එසේ නම් දිනයන් සහ නඩු අංකයන් සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12 අධ්‍යාපන, වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල, විස්තර සහ ඒවා ලබාගන්නා ලද ආයතනවල නම්) :————.

13. දැනට නිරත රක්ෂාව හා ඊට පෙර කරන ලද රක්ෂාවල් :————.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|
| ... ........ | ......... | ............ | .................. |
| ... ........ | ......... | ............ | .................. |
| ... ........ | ......... | ............ | .................. |

(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න). සැ. යු. රජය යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහත 15 වැනි කොටුවේ සඳහන් කළ යුතුය :————.

14. විශේෂ සුදුසුකම් : දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතහොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

15. තවත් තොරතුරු කිසිවක් ඇත්නම් ඒවා :————.

16. මෙහි ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකුවීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :————.

1–945—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කම්කරු ශ්‍රේණියේ I සහ II වන පංතියේ යන්ත්‍ර ශිල්පී තනතුරු (MACHINIST)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කම්කරු ශ්‍රේණියේ I වන සහ II වන පංතියේ යන්ත්‍ර ශිල්පී (MACHINIST) තනතුරු සඳහා **ඉල්ලුම්පත් පහත සඳහන් සුදුසුකම් ඇති අයවළුන්ගෙන් පමණක්** කැඳවන බව මෙයින් දන්වනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**— I වන පංතියේ යන්ත්‍ර ශිල්පී තනතුරු සඳහා වාර්ෂික වැටුප—රු. 3,240—12×60—රු. 3,960 (ඒකාබද්ධ)

**II වන පංතියේ යන්ත්‍ර ශිල්පී තනතුරු සඳහා වාර්ෂික වැටුප :** රු. 2,640—15×60—රු. 3,540 (ඒකාබද්ධ)

3. **වයස් සීමාව.**—I වන පංතිය සඳහා යටත් පිරිසෙයින් වයස අවුරුදු 25 කට නොඅඩු හා අවුරුදු 35 කට නොවැඩි විය යුතු අතර, II වන පංතිය සඳහා වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නවුන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—I වන පංතියේ යන්ත්‍ර ශිල්පී තනතුරු සඳහා :—

(අ) කනිෂ්ඨ පංතිය සමත්විය යුතුය.

(ආ) පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් II වන පංතියේ යන්ත්‍ර ශිල්පියෙකු වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) පිහිටුවීමේ වැඩවලදී ඩයල් ගේජ් ආදිය භාවිතා කිරීමට පිළිවන් විය යුතුය.

(ඈ) යෝග්‍ය අවස්ථාවලදී තමන්ගේ ආයුධ මුවහත් කර පිළියෙල කිරීමට පිළිවන් විය යුතුය..

(ඉ) ආයුධ වල කපන කෝණ හා රේක්ක කෝණය නියම පරිදි ගණන් බලා ගැනීමට පිළිවන් විය යුතුය.

**II වන පංතියේ යන්ත්‍ර ශිල්පී තනතුරු සඳහා :—**

(අ) කනිෂ්ඨය සමත්විය යුතුයි.

(ආ) පිළිගත් ආයතනයක යන්ත්‍ර ශිල්පියෙකු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුයි.

(ඇ) සූක්ෂමමාන කියවීමට හා සකස් කිරීමට පිළිවන් විය යුතුයි.

(ඈ) වෘත්තියට අදාළවන සියලුම ආයුධවල හා අනෙකුත් උපකරණවල නම් හා ඒවායේ සාමාන්‍ය නඩත්තුව පිළිබඳව දැනීමක් තිබිය යුතුයි.

(ඉ) තමන්ගේ වැඩවලට අදාල වන සියලුම ඇඳීම් කියවීමට පුළුවන් විය යුතුයි.

(ඊ) තමන් නියුක්ත විය යුතුවන යන්ත්‍රය දක්ෂ ලෙස ක්‍රියා කරවීමට පිළිවන් විය යුතුය.

5. **සේවයට යෙදීමේ වගන්ති.**—මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

6. **ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීම.**—මෙයට යාකර ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ අයදුම් පත් සහතිකවල පිටපත් සමඟ 1973 පෙබරවාරි 28 වැනි දිනට හෝ ඊට ප්‍රථම පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. එක් එක් තනතුරු සඳහා වෙනම ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුය. නියමිත පෝරමය අනුව සකස් නොකළ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ. දෙපාර්තමේන්තු සේවකයින්ගේ අයදුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වන ඡේදයේ මුල පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් වලට අදාළ වූ පොදු කොන්දේසිවලට ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

පී. ඊ. ජිනේන්ද්‍රදාස,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1973.01.09 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

ආදර්ශ ආකෘති පත්‍රය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කම්කරු ශ්‍රේණියේ I වන හා II වන පංතියේ යන්ත්‍ර ශිල්පී තනතුරු (MACHINIST)**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකිකයෙකු නම් පරම්පරාවෙන්ද, ලියාපදිංචියෙන්ද යන්න සඳහන් කළ යුතුයි)

4. 1973.2.28 වැනි දිනට වයස :————.

5. උපන් දිනය හා ස්ථානය :

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

6. ලබා ඇති අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් :————.

7. පාසලින් අස්වූ දින සිට කරන ලද රක්ෂා පිළිබඳ විස්තර සහ දැනට රැකියාවක් කරනු ලබන්නේ නම් වැටුප් ක්‍රමය : ————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳව දැනීමක් ඇත්තවුන් දෙදෙනෙකුගේ නම්, ඔවුන්ගේ තරාතිරම් හා ලිපිනයන් :
i ————.
ii ————.

9. ඉල්ලුම් කරන තනතුර :————.

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, යම් හෙයකින් ම විසින් සඳහන් කර ඇති තොරතුරු වැරදි බව හෝ අසත්‍ය බව ඔප්පු වුවහොත් මේ ,පදවියට මා පත්වීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–955/1—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කම්කරු ශ්‍රේණියේ I සහ III වන පංතියේ යාන්ත්‍රික ශිල්පී තනතුරු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කම්කරු ශ්‍රේණියේ I හා III වන පංතියේ යාන්ත්‍රික ශිල්පී තනතුරු සඳහා ඉල්ලුම් පත් පහත සඳහන් සුදුසුකම් ඇති අයවළුන්ගෙන් පමණක් කැඳවන බව මෙයින් දන්වනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—I වන පංතියේ යාන්ත්‍රික ශිල්පී තනතුරු සඳහා වාර්ෂික වැටුප රු. 3,240—12×60— රු. 3,960. (ඒකාබද්ධ).

III වන පංතියේ යාන්ත්‍රික ශිල්පී තනතුරු සඳහා වාර්ෂික වැටුප රු. 2,208—9×54—රු. 2,694 (ඒකාබද්ධ).

3. **වයස් සීමාව.**—I වන පංතිය සඳහා යටත් පිරිසෙයින් වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුඅතර, III පංතිය සඳහා වයස අවුරුදු 20 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නවුන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—1 වන පංතියේ යාන්ත්‍රික ශිල්පී තනතුරු සඳහා :—

(අ) කනිෂ්ඨ පංතිය සමත් විය යුතුය.

(ආ) පිළිගත් ආයතනයක මෝටර් රථ අලුත්වැඩියාව ගැන අවුරුදු 10 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ඇ) රෝද ඇතුළු ඇන්ජිමේ සහ චැසියේ විවිධ අවයව පිළිබඳ පරතර සම්බන්ධයෙන් දැනීමක් තිබිය යුතුය.

(ඈ) බෙයරිං එකට සවිකිරීම, පෙළ ගැස්ම, සෝදිසි කිරීම හා ටෝන්රෙන්චය භාවිතය පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය.

(ඉ) වාහනයේ විදුලි පද්ධතිය පිළිබඳව සාමාන්‍ය දැනීමක් තිබිය යුතුය.

(ඊ) පැට්‍රල් සහ කලුතෙල් යන දෙවර්ගයේම ඇන්ජින්වල නිතර නිතර ඇතිවන වැරදි ඉක්මණින් හා නිවැරදි ලෙස සොයා ගෙන, ඒවා හරිගැස්වීමට පිළිවන් විය යුතුය.

(උ) යෝග්‍යවන අවස්ථාවලදී කළු තෙල් ඉන්ධන ක්‍රමයෙන් තෙල් පිටවීමට සැලැස්වීමට (BLEED) පිළිවන් විය යුතුය.

(ඌ) අවශ්‍යවන පරමාණුකරය හා පොම්පය ශුද්ධකර, පරීක්ෂා කර සකස් කිරීමට පිළිවන් විය යුතුය.

**III වන පංතියේ යාන්ත්‍රික ශිල්පී තනතුරු සඳහා :**

(අ) VI වන පංතිය සමත් විය යුතුය.

(ආ) 1/16" පරිමාණයක් කියවීමට හා එබඳු භාග ගණන්වලින් දැක්වෙන වාර්තා සටහන් කිරීමට ද පිළිවන් විය යුතුය.

(ඇ) පිළිගත් ආයතනයක මෝටර් රථ අලුත්වැඩියාව ගැන යටත් පිරිසයින් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඈ) සිය වෘත්තියට අදාල වන ආයුධවල නම් භාවිතය හා ඒවා තබා ගැනීම පිළිබඳව පුරුද්දක් තිබිය යුතුය.

(ඉ) සුළු අලුත්වැඩියාවන් කිරීමට හැකියාව තිබිය යුතුය.

5. **සේවයට යෙදීමේ වගන්ති.**—මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

6. **අයදුම් පත්.**—මෙයට යා කර ඇති ආදර්ශ පෝර්මය අනුව සකස් කළ අයදුම්පත් සහතික පිටපත් සමග 1973 පෙබරවාරි මස 28 වැනි දිනට හෝ ඊට ප්‍රථම පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එක් එක් තනතුර සඳහා වෙන වෙනම ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුය. නියමිත පෝර්මය අනුව සකස් නොකළ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයම්දු පත් ලැබුණු බව දන්වනු නොලැබේ. දෙපාර්තමේන්තු සේවකයින්ගේ අයදුම් පත් එම ප්‍රධානීන්ගේ මාර්ගයේ ඉදිරිපත් කළ යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II අ) වන ඡේදයේ මුල පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් වලට අදාල වූ පොදු කොන්දේසිවලට ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

පී. ටී. ජිනේද්‍රදාස,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1973.01.09 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කම්කරු ශ්‍රේණියේ I වන හා III වන පංතියේ යාන්ත්‍රික ශිල්පී තනතුරු

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.
   (ලාංකිකයෙකු නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචියෙන් ද යන්න සඳහන් කළ යුතුය.)

4. 1973.2.28 දිනට වයස :————.

5. උපන් දිනය හා ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයම්දුකරුගේ පියාගේ :————.

6. ලබා ඇති අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් :————.

7. පාසලින් අස් වූ දින සිට කරන ලද රක්ෂා පිළිබඳ විස්තර සහ දැනට රැකියාවක් කරනු ලබන්නේ නම් වැටුප් ක්‍රමය : ————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳව දැනීමක් ඇත්තවුන් දෙදෙනෙකුගේ නම්, ඔවුන්ගේ තරාතිරම් හා ලිපිනයන් :
   i ————.
   ii ————.

9. ඉල්ලුම් කරන තනතුර :————.

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, යම් හෙයකින් ම විසින් සඳහන් කර ඇති තොරතුරු වැරදි බව හෝ අසත්‍ය බව ඔප්පු වුව හොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සෙකු වන බව හා, පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයන් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමිවී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–955/2—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**රජයේ බෙහෙත් ගබඩාවේ III වන ශ්‍රේණියේ වැඩමූලික තනතුර**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රජයේ බෙහෙත් ගබඩාවේ III වන ශ්‍රේණියේ වැඩ මූලික තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි මතු දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුකරණයෙන් පිළියෙල වූ අයදුම් පත් 1973.02.26 වනදා හෝ ඊට කලින් කොළඹ 1, තැ. පෙ. 500 හිමි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලේඛණගත තැපැලෙන් එවිය යුතුය.

2. **වැටුප්ං ක්‍රමය.**—මෙම තනතුරට වර්ෂයකට රුපියල් ?,450—90×12—4,530 ක ඒකාබද්ධ වැටුපක් හිමිවේ.

3. **වයස් සීමාව.**—අයදුම්පත් පියවන දිනට අවුරුදු 21 ට නොඅඩු වත්, අවුරුදු 35 ට නොවැඩිවත් සිටිය යුතුය.

**සැලකිය යුතුයි :** දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයන් කෙරෙහි උපරිම වයස් සීමාව නොයෙදේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—

(i) අධ්‍යාපන :

(අ) ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන් දෙක සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

හෝ

(ආ) සිංහල/දෙමළ භාෂාව, භෞතික විද්‍යාව, ගණිතය සහ තවත් විෂයයන් තුනක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී පියවා ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සමාන්‍ය පෙළ) ලබා තිබිය යුතුය.

(ii) වෘත්තීය :

(අ) ලංකා කාර්මික විද්‍යාලය විසින් පවත්වනු ලබන කණිෂ්ඨ කාර්මික නිලධාරි (යාන්ත්‍රික හා විදුලි) සහතික විභාගයෙන් හෝ සම තත්ත්වයේ විභාගයකින් සමත් වී,

**සටහන.**—නිර්වින්දන යන්ත්‍ර සාමාන්‍ය ශල්‍යාගාර උපකරණ සහ ආරෝග්‍යශාලා උපකරණ පාවිච්චි කිරීම හා අලුත්වැඩියා කිරීම පිළිබඳව හෝ ටින්කර් වැඩ, වැල්ඩින් වැඩ හා වඩුවැඩ ගැන පළ පුරුද්දක් ඇති අයගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. **සේවයෙහි යෙදවීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනම මත වේ.

6. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමග පහත දැක්වෙන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. (මුල් සහතික නොවේ.)

(ඒ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අනුව නිකුත් කරන ලද සහතික හෝ භාරගනු නොලැබේ.) රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා විසින් නිකුත් කරණ ලද උප්පැන්න සහතිකය හෝ විශේෂ සහතිකය. (උප්පැන්න ලියාපදිංචි කොට නොමැති අයදුම් කරුවන් සම්බන්ධයි.) අයදුම්කරුවන්ගේ වයස ඔප්පු කිරීම සඳහා පිළිගනු ලැබේ.

(බී) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(සී) ලබා ඇති කාර්මික සුදුසුකම් දැක්වෙන සහතිකය.

(ඩී) පළපුරුද්ද දැක්වෙන සහතිකය.

(ඊ) චරිතය පිළිබඳව ළඟදීම ලබාගත් සහතික 3 ක් (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් මෙය ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

7. රජයේ හෝ අර්ධ රජයේ බල මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් ස්වකීය පත්වීම් බලධාරියා මගින්ම ඉදිරිපත් කළ යුතුය.

8. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙම දැන්වීමෙහි සඳහන් නියමයන්ට අනුකූලව නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසෙහි (IIඅ) වන ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම පිළිබඳව පොදු කොන්දේසි ද කියවා බලන්න.

ජී. අමරසේන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන).

තැ. පෙ. 500,
ගාලු මුවදොර මහ ලේකම් පාය,
කොළඹ 1.

### අයදුම්පත් ආකෘතිය

### රජයේ බෙහෙත් ගබඩාවේ III වන ශ්‍රේණියේ වැඩමුලික තනතුර සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. උපන් දියත හා අයදුම්පත් පියවන දිනට වයස :————.
උපන් දිනය :————, අවුරුදු :————, මාස :————, දින :————.

4. ජාතිය :————.
(ලාංකික වනුයේ පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද යන වග) :

5. රජයේ හෝ අර්ධ රජයේ බල මණ්ඩලයක සේවයේ නියුක්ත අයෙක් නම්, දරණ තනතුර හා සේවා ස්ථානය :————.

6. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :————.

7. කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :————.
(සමත් වූ පාඨමාලා පමණි)

8. ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර :—
(1) නිර්වින්දන යන්ත්‍ර සාමාන්‍ය ශල්‍යාගාර උපකරණ හා ආරෝග්‍යශාලා උපකරණ පිළිබඳව :————.
(2) පින්කර් වැඩ, වෑල්ඩින් වැඩ, වඩුවැඩ පිළිබඳව :————.

9. වෙනත් හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි. එමෙන්ම ම විසින් සපයා ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව තෝරා ගැනීමට කලින් සොයා ගනු ලැබුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගුවීමට ද පත්වීමෙන් පසු එම වරද සොයාගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා තනතුරින් පහ කිරීමටද ඉඩ ඇති බව ද පිළිගනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–845—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

### මුදල් අයකැමි/ලිපිකරු III ශ්‍රේණිය තනතුර

මෙම සංස්ථාවේ ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම්පත් ම විසින් කැඳවනු ලැබේ.

1. **වැටුප් පරිමාණය.**—රු. 380—8×15—500 මාසික (සියලු දීමනා ඇතුලුව)

2. **වයස් සීමාව.**—අවු. 20—40.

3. **අධ්‍යාපනික හා අතිකුත් සුදුසුකම් හා අවශ්‍යතාවයන් :**

(අ) එක්වර හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් විෂයයන් හතරක් සමත්ව තිබීම. (ගණකාධිකරණය විෂයයක් ලෙස සමත්ව තිබිය යුතුය.)

(ආ) මුදල් අයකැමියෙකු වශයෙන් රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවුරුදු 3ක පළපුරුද්ද.

(ඇ) තෝරා පත් කෙරෙන අපේක්ෂකයා විසින් මුදලින් රු. 1,000 ක සහ විශ්වාස ඇප ඔප්පුවක මාර්ගයෙන් රු. 10,000 ක ඇපයක් තැබිය යුතුය.

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථා කාර්යාලයෙන් ලබා ගත්තා ආකෘති පත්‍රවල පිළියෙල කෙරුන අයදුම්පත් කොළඹ 5, 2බී ද ෆොන්සේකා පාරේ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති වෙත 1973.02.10 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයෙන් පෞද්ගලිකව ද ලිපිනය සහිත මුද්දර ගැසූ 9"×4" ප්‍රමාණයේ කවරයක් සභාපති වෙත එවීමෙන් ද අයදුම්පත් ලබා ගත හැක.

අයදුම්පත් ලැබුන බව දන්වනු නොලැබේ.

2බී, ද ෆොන්සේකා පාර,
කොළඹ 5.
1973.01.01.

සභාපති,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

1–997—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැදපනේ කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැදපනේ කෝරළේ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම තම—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 60 ට නොවැඩි බවටත්,

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුත් බවටත්,

(ඇ) (i) 1925 සහ 1944 කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය (ස්වභාෂා) හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය,

නැතහොත්

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමර්ථවී ඇති බවටත්, සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්. (එකක් කොට්ඨාශයේ ග්‍රාම සේවකගෙන් විය යුතුයි.)

4. රජයේ සේවකයින්, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගේ සහ සංස්ථා සේවකයින්ගේ ද, වයස අවුරුදු 30 ට අඩු හෝ 60 ට වැඩි හෝ අපේක්ෂකයින්ගේ අයදුම්පත් භාරගනු නොලැබේ.

5. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. එහෙත්, එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

6. අපේක්ෂකයන් මැදපනේ ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

7. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1973 මාර්තු මස 20 වැනි දිනට හෝ ඊට ප්‍රථම "දිසාපති, කච්චේරිය, නුවරඑළිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

ඇම්. සෙනෙවිරත්න බණ්ඩා,
නුවරඑළිය දිසාපති.

1973 ජනවාරි 10 දින,
නුවරඑළිය දිසාපති කාර්යාලයේ දීය.

**නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැදපනේ කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර පදිංචිය හා එම ස්ථානයේ පදිංචි කාලය :————.
(පදිංචි ග්‍රාමසේවක වසම ද සඳහන් කරන්න.)

3. 1973 මාර්තු මස 20 වැනි දිනට සම්පූර්ණ වයස :—
අවුරුදු :——, මාස :——, දින :——.

4. විවාහකද ? අවිවාහකද ? යන වග :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. රක්ෂාව :————

7. ණය කරදර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

8. තමා සතු දේපලවල විස්තර, පිහිටීම, එකිනෙකේ වටිනාකම සහ ප්‍රමාණය :————.
(උගස් කර තිබේ නම් ඒ පිළිබඳ විස්තර ද සඳහන් කළ යුතුය.)

9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? :————.

10. මෙම තනතුර සඳහා වෙනත් හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1-942—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

මාණ්ඩලික සහකාර/භාෂා පරිවර්තක තනතුර

පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 26 ට වැඩිවිය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුත්තේ මෙම කාර්යාලයෙන් ලබාගත යුතු නියමිත ආකෘති පත් අනුවය. රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන අය කෙරෙහි මෙම වයස් සීමාව බලපවත්වනු නොලැබේ.

(i) **තනතුර.**—මාණ්ඩලික සහකාර/භාෂා පරිවර්තක විශේෂ ශ්‍රේණිය.

(ii) **සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් තිබිය යුතුය. සිංහල හා ඉංග්‍රීසි භාෂා පිළිබඳව හොඳ දැනුමක්, සහ භාෂා පරිවර්තනය පිළිබඳව පුහුණුවක් තිබිය යුතුය. තෝරාගත් ඡේදයක් ඉංග්‍රීසියෙන් සිංහලටත්, සිංහලෙන් ඉංග්‍රීසියටත් පරිවර්තනය කිරීමේ පරීක්ෂණයකට සංස්ථාව විසින් නියම කරන පරිදි පෙනී සිට එයින් සමත් විය යුතුය.

(iii) වැටුප් පරිමාණය.—රු. 675—25×5—800.

2. අයදුම් කරුවන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද සලකා බැලීමෙන් පසුව, අදාළ වැටුප් පරිමාණයේ සුදුසු වැටුප් තලයක පිහිටුවා පත්වීම් ප්‍රදානය කිරීම සලකා බලනු ලැබේ.

3. ඉල්ලුම්පත් හා විස්තර, ලිපිනය සහිත මුද්දර ගැසූ ලියුම් කවරයක් මා වෙත එවීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ හෝ ලබාගත යුතුය.

4. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රාජ්‍ය සංස්ථාවල සේවයෙහි නියුතු අයදුම් කරුවන්ගේ ඉල්ලුම්පත් සේවයෙන් මුදා හැරීම පිළිබඳව සේවා යෝජකයාගේ නිර්දේශයක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම් පත් 1973.2.8 වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, සේවක මණ්ඩල කළමනාකරු.
1 වැනි මහල,
චාර්ටර්ඩ් බැංකු ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973.01.11.

1-995—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ආධුනික සැලසුම්කරු තනතුර

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මීට යාකර තිබෙන ආකෘති පත්‍රයේ පිළියෙල කළ ඉල්ලුම් පත් 1973 පෙබරවාරි මස 15 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි කොළඹ 7, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත එවිය යුතුයි. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

2. **වැටුප හා සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :**

(i) ආධුනික සැලසුම්කරු තනතුර තාවකාලිකය. ඒ සඳහා රු. 3,000—3×90—රු. 3,270ක ඒකාබද්ධ වාර්ෂික වැටුපක් ගෙවනු ලැබේ. ආධුනික කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කරන ආධුනික සැලසුම්කරුවෝ II පෙළ සැලසුම්කරුවන් තෝරා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විභාගය සමත් වූ විට II පෙළ සැලසුම්කරුවන් වශයෙන් පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන්නාහ. එසේ සුදුසුකම් ලබන්නවුන් පුරප්පාඩු ඇතිවන විට රු. 3,576—20×144—රු. 6,456 (රු. 5,304 ට පෙර කාර්යක්ෂමතා කඩඉම) ඒකාබද්ධ වැටුප් ක්‍රමය මත පත් කරනු ලැබේ.

(ii) ආධුනික කාලය වර්ෂ 2 කි. එය දෙපාර්තමේන්තුවේ සැලසුම් කාර්යාලවලට අනුයුක්තව ගත කළ යුතුයි.

**සටහන.**—කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික අභ්‍යාසායතනයෙහි හෝ සේවයට බඳවා ගන්නා විට ශ්‍රී ලංකා ජනරජය විසින් අනුමත වෙනත් එබඳු ආයතනයක සැලසුම් කිරීම පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාව හෝ ගොඩනැගිලි තැනීම පිළිබඳ 3න් අවුරුදු අර්ධ කාලීන පාඨමාලාව හෝ සතුටුදායක ලෙස දැනටමත් සම්පූර්ණ කර තිබෙන ආධුනික සැලසුම්කරුවන්ට රු. 3,090 වාර්ෂික වැටුප ගෙවනු ලැබේ.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ II පෙළ සැලසුම්කරුවන් ලෙස සුදුසුකම් ලැබීම සඳහා සිය ඉගෙනීමේ කටයුතුවල නියම ලැදියාවකින් නිරතවන බවටත්, පුහුණුවීමේ පාඨමාලාව අවසන් වූ විට නියම කරනු ලැබුවහොත් වර්ෂ 5 කට නොඅඩු කාල සීමාවක් තුළ II පෙළ සැලසුම්කරුවන් වශයෙන් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් පුහුණුවීමේ පාඨමාලාව ආරම්භ වීමට පෙර දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට බැඳිය යුත්තාහ. ගිවිසුමේ කොන්දේසි නිසි ලෙස අනුගමනය කරනු වස් අභ්‍යාසලාභීහු සහ ඔවුන්ගේ දෙමව්පියෝ හෝ නීත්‍යානුකූල භාරකරුවෝ ඇපකරුවන් දෙදෙනෙකු සමග රු. 2,000 ක ඇප ඔප්පුවකට අත්සන් කළ යුත්තාහ.

(iv) තෝරා ගත් අයදුම්කරුවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත යයි සනාථ කරනු සඳහා පත්වීම් ලැබීමට පෙර රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිට සමත් විය යුතුයි.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සතුටුදායක ලෙස ඔප්පු කළ යුතුයි :—

(i) **ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බව,**

(ii) **1973 පෙබරවාරි 15 වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු බව හා අවුරුදු 24 ට නොවැඩි බව (අනෙක් සුදුසුකම් තිබේ නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නියුක්ත අයදුම් කරුවන් කෙරෙහි මෙහි උපරිම වයස් සීමාව අදාළ නොවේ.)**

(iii) මනා චරිතයකින් යුක්ත බව,

(iv) කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික අභ්‍යාසායතනයෙහි හෝ ශ්‍රී ලංකා ජනරජය විසින් පිළිගත් වෙනත් එබඳු ආයතනයක හෝ සැළසුම් කිරීම පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව හෝ ගොඩනැගිලි තැනීම පිළිබඳ 3න් අවුරුදු අර්ධකාලීන පාඨමාලාව හෝ සම්පූර්ණ කර තිබෙන බව.

**4. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඔවුන්ගේ ඉල්ලුම්පත්වලට ඇමිණිය යුතුයි :—**

(i) **ලබා තිබෙන උසස්ම අධ්‍යාපනික හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,**

(ii) **උප්පැන්න සහතිකය (අධ්‍යාපන සංග්‍රහයේ පරමාර්ථ සඳහා** නිකුත් කරන ලද බෞතීස්ම කිරීමේ සහතිකය පිළිගනු **නොලැබේ.)**

(iii) චරිතය පිළිබඳව මෑතදී ලබාගත් **සහතික තුනක් (ඉන් එකක් අයදුම්කරු අවසන් වරට ගිය පාසලේ විද්‍යාලයාධි** පතිගෙන් විය යුතුයි.)

**සටහන.**—සහතිකවල මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.

5. දැනට ශ්‍රී ලංකා ජනරජය යටතේ හෝ එහි ප්‍රාදේශීය බල මණ්ඩලයක් යටතේ සේවයෙහි නියුතු වූවන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි.

**6. කොළඹ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් සිය වියදමින් පෙනී සිටිය යුතුයි.**

**7. අයදුම්කරුවෙකු විසින් සිය ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. තෝරා ගැනීමෙන් පසු එය සොයාගනු ලැබුවහොත් සේවයෙන් නෙරපනු ලැබේ.**

**8. රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කරන්නවුන් පිළිබඳ මෙම** ගැසට් පත්‍රයේ I කොටස : (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් **කර තිබෙන පොදු කොන්දේසිවලටද අවධානය යොමු කරවමි.**

**පී. එච්. පෙරේරා,**
**වාරිමාර්ග අධ්‍යක්ෂ.**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1138,
කොළඹ, 1973 ජනවාරි 13.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

(**සැලකිය යුතුයි.**—ඉල්ලුම් පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ආධුනික සැළසුම්කරු තනතුර සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කර වාරිමාර්ග අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 7 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) ඉල්ලුම්කරු උපන් දිනය හා ස්ථානය :————
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
   (ආ) (i) අයදුම්කරුගේ පියා :————.
   (ii) පියාගේ පියා :————.
   (iii) පියාගේ පියා උපන් ස්ථානය :————.

4. විවාහකද අවිවාහකද යන වග :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

6. කාර්මික සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

7. පාසලෙන් අස්වූවාට පසු කළ රක්ෂාව සහ/හෝ ලැබූ පුහුණුව පිළිබඳ විස්තර :————.

8. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක කලින් සේවය කර තිබේ නම් එයින් අස්වීමට හේතු සඳහන් කරන්න :————.

9. අපරාධයක් පිළිබඳව උසාවියකදී වරදකරු කරනු ලැබුවේ නම් කළ වරද හා ලැබුණු දඬුවම සඳහන් කරන්න :————.

10. චරිත සහතික දුන් තිදෙනෙකුගේ නම්, තනතුරු සහ ලිපිනයන් සඳහන් කරන්න :————.

මෙම ඉල්ලුම් පතෙහි ම විසින් සඳහන් කරන ලද කරුණු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**1–870—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය**

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කම්කරු ශ්‍රේණියේ I පන්තියේ යතුරු ලියන කාර්මික තනතුර**

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කම්කරු ශ්‍රේණියේ I වැනි පන්තියේ යතුරු ලියන කාර්මික තනතුර සඳහා පහත දැක්වෙන **සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි** පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද **ඉල්ලුම්පත් 1973 පෙබරවාරි මස 17 වැනි දින හෝ ඊට පෙර, කොළඹ 7, අංක 22, ඊඩ් මාවතේ** පිහිටි රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ **කොමසාරිස්ට ලැබෙන සේ එවිය යුතුය.**

**2. වැටුප් පරිමාණය :**

(අ) කොළඹ නාගරික සීමාව තුළ සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5 ක අරය තුළ වූ ප්‍රදේශය තුළ හෝ ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයේ හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල හෝ සේවය කරන්නවුන් සඳහා—

පළමු හය මස තුළ දිනකට රු. 10.70 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 3,240—60×12—රු. 3,960 ක ඒකාබද්ධ වැටුපක්. (පළමු හය මස තුළ දිනකට රු. 3.86 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 1,170—42×12—රු. 1,674 ක කල්පිත වැටුපක් 69.10.01 ට පෙර.)

(ආ) පිට පළාත්වල ඉංජිනේරු කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නොලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා—

**පළමු හය මස තුළ දිනකට රු. 9.70 බැගින් සහ ඊට** පසු වර්ෂයකට රු. 3,060—60×9—රු. 3,600 ක ඒකාබද්ධ වැටුපක්. (පළමු හය මස තුළ දිනකට රු. 3.30 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 1,044—42×8—රු. 1,380 ක කල්පිත වැටුපක් 69.10.01 ට පෙර.)

**3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(අ) සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි :—

(i) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ යෙදී සිටින්නවුන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ii) සියළුම වර්ගවල යතුරු ලියනා පිළිබඳව හොඳ දැනීමක් තිබිය යුතුය.

(iii) අවශ්‍යවූ විට යුළු සුළු අවයව සාදා සවි කිරීමට විළිවන් විය යුතුය.

(ආ) ඉහත (අ) හි සඳහන් සුදුසුකම්වලට අතිරේකව පහත **සඳහන් සුදුසුකම්වලින් එකක්වත් තිබිය යුතුය. එම සුදුසුකම් දක්වා ඇත්තේ වැඩි සැලකිල්ලක් ලබන අනු** පිළිවෙළිනි :—

**(I) දෙපාර්තමේන්තු සේවකයින් සඳහා :**

(අ) රජයේ දෙපාර්තමේන්තුවක II පන්තියේ අදාළ තනතුරක අවුරුදු 8 ක සේවයක් තිබීම,

නැතහොත්

(ආ) **පිළිගත් ආයතනයක (I) පළමුවැනි පන්තියේ වෘත්තිකයෙකු ලෙස යටත් පිරිසෙයින් අවුරුදු 6 ක සේවයක් හෝ (II) දෙවැනි පන්තියේ වෘත්තිකයකු ලෙස අවුරුදු 12 ක සේවයක් හෝ ඇත්තාවූ ද (III) දෙවැනි පන්තියේ අඩුම වශයෙන් අවුරුදු 3 ක සේවයක් ඇත්තාවූ ද සේවකයෝ—(සහතික මගින් සනාථ කළ යුතුයි.)**

නැතහොත්

(ඇ) පිළිගත් ආයතනයක පළමුවෙනි පන්තියේ අදාළ වෘත්තියකරුවකු වශයෙන් ද, රජයේ දෙපාර්තමේන්තුවක අදාළ II වන පන්තියේ සේවකයකු වශයෙන් ද, එකතුව අවුරුදු 9 කට නොඅඩු සේවයක් තිබීම. (මෙම ගණයේ සේවකයින් සලකා බලනු ලබන්නේ ඉහත සඳහන් (අ), (ආ) ගණයේ සේවකයින් නොමැති අවස්ථාවලදී අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිවය. පිළිගත් ආයතනයෙහි පූර්ව සේවය සහතික පත්‍ර මගින් සනාථ කළ යුතුයි.)

(II) බාහිර අයදුම්කරුවන් :

(අ) පිළිගත් ආයතනයක පළමුවෙනි පන්තියේ අදාල වෘත්තියකරුවකු වශයෙන් අවුරුදු 6 කට නොඅඩු සේවයක් සහිතව අදාළ වෘත්තියකරුවකු වශයෙන් අවුරුදු 10 ට නොඅඩු සේවයක් තිබීම (සහතිකපත් මගින් සනාථ කළ යුතුයි.)

(ආ) මනා චරිතයකින් යුක්තවීම (වගකිවයුතු පුද්ගලයින් අත්සන් කළ චරිත සහතික ඉදිරිපත් කළ යුතුයි.)

**සටහන :** එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තිකයකු ලෙස කළ සේවය පිළිගත් ආයතනයක සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

4. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසුව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ එම හිමිකම් නොවෙනස් වනු ඇත.

(i) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතා වන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු වන්නේ නම් පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(ii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරාගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ තත්ත්වයේ පවතිනු ඇත.

(iii) පත් කරනු ලබන්නා තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(iv) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

5. **සේවා කොන්දේසි.**—අංක 765 සහ 69.06.09 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 වන ඡේදයේ (අ) සහ (ආ) වගන්ති අදාළ වනු ඇත.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් කෙළින්ම රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්ට ද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටස : (II අ) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන ස්ථිර පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසිද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී සතියක් ඇතුළත ඉල්ලුම් පත් ලැබුණු බවට ලිපියක් නොලදහොත් වහාම ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම්පත්‍ර සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1973 ජනවාරි මස 17 වැනි දින,
22, රීඩ් මාවත,
කොළඹ 7.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ II වැනි පන්තියේ සතුරු ලියන අළුත්වැඩියා කරන්නාගේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.

2. ස්ථිර ලිපිනය :———.

3. 1973 පෙබරවාරි මස 17 වැනි දිනට වයස :— අවුරුදු :——,
මාස :——, දින :———.
උපන් දිනය :———.

4. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරු :———.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :———.
(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :———.
(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :———.

5. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :———.

6. අධ්‍යාපන සුදුසුකම් :—

(i) සාමාන්‍ය :———.
(ii) වෘත්තිය/හා/හෝ කාර්මික සහතිකවල විස්තර :———.
(iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර :———.

7. නිවේදනයේ 3 වැනි ඡේදය යටතේ සේවා විස්තර :———. (සේවය කළ ආයතන, සේවා කාලයන්, දැරූ තනතුරු සඳහන් කළ යුතුයි.)

8. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

9. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය, (ආ) නඩු නොම්මරය, (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න : ———.

10. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :———.

11. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.

12. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුණු හා නිදහස් කරන ලද දිනය පිළිබඳ විස්තර :———.

13. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—

(i) දරණ ලද තනතුර :———.
(ii) නියුක්තව සිටි වකවානුව :———.
(iii) අස්වීමට හේතුව :———.

14. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්—

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :———.
(ආ) සේවයේ යෙදී සිටි කාලය :———.
(ඇ) සේවය නතර කිරීමට හේතු :———.

15. දැනට යෙදී සිටින රක්ෂාව :—

(i) ආයතනය :———.
(ii) තනතුර හා ශ්‍රේණිය :———.
(iii) ඊට පත්වූ දිනය :———.
(iv) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? : ———.
(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය : ———.

16. වෙනත් කරුණු :———.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු

සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය :
ඔබේ අංකය : ආ 5/.

රා. හා. කො.,

මෙම අයදුම්පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම් පත් භාරගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන් ................. අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව් මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි :—

..........................................

..........................................

———————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

———————,
පදවි නාමය.

(*අදාළ නැති කොටස් කපා හරින්න)

1–957—73.01.26 දින අංක 44 දරන ගැසට් පත්‍රය

---

**මහවැලි සංවර්ධන මණ්ඩලය**

**පුරප්පාඩු**

මණ්ඩලීය සේවාව යටතේ පහත දැක්වෙන තනතුරු සඳහා ලාංකිකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත්වල පිළියෙල කර 1973 පෙබරවාරි 15 දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 5, ජාවත්ත පාරේ, අංක 11, 'මහවැලි සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ' වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. තැපෑලෙන් අයදුම්පත් ආකෘති ලබාගනු කැමති අය, ලිපිනය ලියූ මුද්දර ගැසූ කවරයක් එවිය යුතුය :—

**1. සැලසුම් කාර්යාල සහකාර**

**වයස.**—අවුරුදු 40 ට නොඅඩු විය යුතුය.

**වැටුප් පරිමාණය.**—රු. 800—9×40—රු. 1,160 (මසකට).

**සුදුසුකම් හා පළපුරුද්ද :**

(අ) ජ්‍යෙ. පා. ස. විභාගයෙන් හෝ සමාන විභාගයකින් ශුද්ධ ගණිතය ඇතුළු සාමාර්ථයක්

හා

(ආ) පිළිගත් කාර්මික ආයතනයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාවකින් හෝ ගොඩනැගිලි නිර්මාණය හා සැලසුම් ශිල්පය පිළිබඳ 3 අවුරුදු අර්ධකාලීන පාඨමාලාවකින් සාමාර්ථයක් හෝ ඉහළ සුදුසුකම්

සහ

(ඉ) II ශ්‍රේණියේ සැලසුම්කරුවන් සඳහාවූ රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක් මගින් පවත්වන ලද පිළිගත් විභාගයකින් සාමාර්ථය හා ඉංජිනේරුමය දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සැලසුම් ශිල්පියෙකු ලෙස අවුරුදු 20 ක පළපුරුද්දක්. යටත් පිරිසෙයින් මෙයින් අවුරුදු 5 ක් I ශ්‍රේණියේ සැලසුම් ශිල්පියෙකු ලෙස විය යුතුය.

**2. සැලසුම්කරු, II ශ්‍රේණිය**

වයස .—අවුරුදු 21 ට නොඅඩු විය යුතුයි.

**වැටුප් පරිමාණය.**—රු. 425—11×20—රු. 645 (මසකට).

**සුදුසුකම් හා පළපුරුද්ද :**

(අ) ජ්‍යෙ. පා. ස. විභාගය හෝ සමාන විභාගයකින් ශුද්ධ ගණිතය ඇතුළු සාමාර්ථයක්

හා

(ආ) පිළිගත් කාර්මික ආයතනයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාවකින් හෝ ගොඩනැගිලි නිර්මාණය හා සැලසුම් ශිල්පය පිළිබඳ 3 අවුරුදු අර්ධකාලීන පාඨමාලාවකින් සාමාර්ථය හා අවුරුදු දෙකක පළපුරුද්දකින් පසුව

(ඉ) II ශ්‍රේණියේ සැලසුම්කරුවන් සඳහාවූ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් මගින් පවත්වන ලද පිළිගත් විභාගයකින් සාමාර්ථය.

**3. සැලසුම්කරු (ආධුනික)**

**වයස.**—අවුරුදු 20 ට නොඅඩුවිය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 300—2×10—රු. 320 (මසකට).

**සුදුසුකම් හා පළපුරුද්ද :**

(අ) ජ්‍යෙ. පා. ස. විභාගය හෝ සමාන විභාගයකින් ශුද්ධ ගණිතය ඇතුළු සාමාර්ථයක්

හා

(ආ) පිළිගත් කාර්මික ආයතනයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාවකින් හෝ ගොඩනැගිලි නිර්මාණය හා සැලසුම් ශිල්පය පිළිබඳ 3 අවුරුදු අර්ධකාලීන පාඨමාලාවකින් සාමාර්ථයක් හෝ ඉහළ විභාගයකින් සාමාර්ථය.

**4. කෘෂිකර්ම නිලධාරි**

**වයස.**—අවුරුදු 21 ට නොඅඩු විය යුතුය.

**වැටුප් පරිමාණය.**—රු. 800—14×40—රු. 1,360.

**සුදුසුකම් හා පළපුරුද්ද.**—පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධියක් හෝ කෘෂිකර්ම පාසැල් ඩිප්ලෝමාව හා අවුරුදු 10 ක පළපුරුද්දක්.

**සැලකිය යුතුයි.**—කෘෂිකර්මය පිළිබඳ අවසාන උපාධි පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගේ අයදුම්පත තාවකාලිකව භාරගනු ලැබේ. ප්‍රතිඵල ප්‍රකාශයට පත්කළ වහාම මෙම අයදුම්කරුවන් විසින් ඒ බව මා වෙත දැනුම් දිය යුතුය.

මණ්ඩල/සංස්ථා හා දෙපාර්තමේන්තුවල නියුතු අයගෙන් එවෙන අයදුම් පත් ඒ ඒ මණ්ඩල/සංස්ථා/දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතු අතර, ඔවුන් තමන් සේවය කරන ඒ ඒ මණ්ඩල/සංස්ථා/රාජ්‍ය සේවයෙන් සම්පූර්ණයෙන් නිදහස් කරවා ගත යුතුය.

ආර්. ඇෂ්. කුක්,
සාමාන්‍යාධිකාරී,
මහවැලි සංවර්ධන මණ්ඩලය.

1973 ජනවාරි මස 17 වෙනි දින,
11, ජාවත්ත පාර, කොළඹ 5.

1–987—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංඛ්‍යා ලේඛනඥ තනතුර**

කොමිෂන් සභා සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරක් වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංඛ්‍යා ලේඛනඥ (තාවකාලික) තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

(1) **වැටුප් ක්‍රමය.**—රු. 1,250—10×50—රු. 1,750 (තෝරාපත් කරනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක නැබීම සලකා බලනු ලැබේ.)

(2) **වයස.**—1973.2.15 දිනට අවුරුදු 20 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. (රාජ්‍ය සේවයේ, සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුක්ත වූවන් සඳහා මෙම අවශ්‍යතාවය බලපානු නොලැබේ.)

(3) **සුදුසුකම් :**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක සංඛ්‍යා ලේඛන විද්‍යාව හෝ ගණිතය හෝ ආර්ථික විද්‍යාව සහිත පළමුවෙනි හෝ දෙවැනි පන්තියේ උපාධියක් හෝ මෙම විෂයයන් එකක් පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ තිබිය යුතුය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංඛ්‍යා ලේඛණ වැඩ ගැන පළපුරුද්දක් ඇති අයට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. පංති සහිත උපාධි පිරිනොනමන විශ්ව විද්‍යාලවල උපාධිධාරීන්ට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් ලබා ඇත්නම් මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සන් ලෙස සලකනු ලැබේ.

(ආ) සංඛ්‍යා ලේඛන විද්‍යාව හෝ ගණිතය හෝ ආර්ථික විද්‍යාව හෝ විෂයයක් සහිත උපාධිධාරීන්ට රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංඛ්‍යා ලේඛන විද්‍යාව පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු පහක පළපුරුද්දක් තිබේ නම් පමණක් මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

(4) රාජ්‍ය සේවයේ, සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(5) සේවා කොන්දේසි කොමිෂන් සභාවේ සේවයේ නියුක්ත සේවකයින්ට අදාල පරිදි වේ.

(6) අදාල වෙනත් තොරතුරුවලට අතිරේක වශයෙන් අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම්පත්‍රවල පහත දැක්වෙන කරුණුද ඇතුළත් කළ යුතුය :—

(අ) සම්පූර්ණ නම, ලිපිනය, සහ වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය.)

(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් (සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.)

(ඇ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමර්ථ වී ඇති උසස්ම විභාග පිළිබඳ විස්තර (සහතික පත්‍රවල පිටපත් සමඟ).

(ඈ) චරිත සහතික ලබාගත් පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් (ඉන් එක් සහතිකයක් අයදුම්කරු අන්තිම වරට ඉගෙනීම ලබන ලද අධ්‍යාපනික ආයතනයේ ප්‍රධානියාගෙන් විය යුතුයි.) මෙම සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.

(7) **ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය.**—1973.2.15 දින හෝ ඊට පෙර කොමිෂන් සභාව වෙත ලැබෙන පරිදි ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවිය යුතුය.

සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 1526,
සී. 82, ග්‍රෙගරි මාවත,
කොළඹ 7,
1973 ජනවාරි 19 වැනි දින.

1–1033—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

### ✓ රාජ්‍ය මැණික් සංස්ථාව

සහකාර ගණකාධිකාරී තනතුර

රාජ්‍ය මැණික් සංස්ථාවේ ඉහත සඳහන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම් පත් සියළු විස්තර සහිතව ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනයට, 1973 පෙබරවාරි මස 15 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සාමාන්‍යාධිකාරී,
රාජ්‍ය මැණික් සංස්ථාව,
409, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

රජයේ/පළාත් පාලන/රාජ්‍ය සංස්ථාවන්හි සේවාවෙහි සිටිනා නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ, ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා මගිනි. එම ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලබන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානීන් විසින් ඔවුන් (පත් කිරීමට) තෝරුණොත් තම සේවාවෙන් රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය සඳහා පත්ව යැමට වහාම නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි.

(අ) **වැටුප් පරිමාණය.**—රු. 600—1,000—10×40 (සියළු දීමනා ඇතුළුව මසකට) (සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් පියවරක තබනු ලැබේ.)

(ආ) **අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද.**—ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුය.

නැතහොත්

වරලත් ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම පරීක්ෂණය සමත් වීම

නැතහොත්

පිරිවැය සහ වැඩ පිළිබඳ ගණකාධිකාරී (ලන්ඩන්) විභාගයේ 1, 2, 3 කොටස් වලින් ලත් සාමාර්ථය.
සිංහලෙන් වැඩ කිරීමේ හැකියාව අත්‍යාවශ්‍ය වේ.

(ඇ) **වයස.**—අවුරුදු 25 ත් 35 ත් අතර විය යුතුයි.

සාමාන්‍යාධිකාරී,
රාජ්‍ය මැණික් සංස්ථාව.

409, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1973 ජනවාරි 10 වෙනිදා.

1–992—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ඉංග්‍රීසි ගුරු විභාගය—1973 මාර්තු

ඉහත නම් සඳහන් විභාගය, අම්බලන්ගොඩ, අනුරාධපුරය, බදුල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, කොළඹ, දඹුල්ල, දික්වැල්ල, ඇහැලියගොඩ, ගල්ගමුව, ගාල්ල, හෝමාගම, හොරණ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුලියාපිටිය, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නාවලපිටිය, මීගමුව, නුවරඑළිය, පේදුරුතුඩුව, පොළොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය, වව්නියාව සහ වේයන්ගොඩ යන මධ්‍යස්ථානයන්හි 1973 මාර්තු මස 31 වන දින පවත්වනු ලැබේ.

2. ආදර්ශ අයදුම් පත්‍රය මේ සමග ඇත. එය ඒ ආකෘතිය අනුවම අඟල් 8×13 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිටපත් කර (අයදුම් පත්‍රය යතුරු ලියනය කරවා ගන්නේ නම් ඉතා මැනවි.) කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ, විභාග කොමසාරිස් වෙත 1973 පෙබරවාරි මස 23 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. විභාග කොමසාරිස්ගේ හෝ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ ආකෘතියට සම නොවන ලෙස අයදුම්කරුවන්ට උවමනා අන්දමට පිළියෙල කොට එවන අයදුම්පත් හා අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු **නොලැබේ.**

3. අයදුම්පත්‍රය විභාග කොමසාරිස් වෙත එවීමට ප්‍රථම "1965 හා ඉන්පසු පවත්වනු ලබන ඉංග්‍රීසි ගුරු විභාගය සඳහා සංශෝධිත" ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රය කියවා මනා අවබෝධයක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අළුතින් සංශෝධනය කර ඇති තැන් මෙම ගැසට් පත්‍රයේ පළවා ඇති ඉංග්‍රීසි දැන්වීමෙහි දක්වා ඇත.

4. ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු මධ්‍යස්ථානයෙන් හෝ ආණ්ඩුවේ පොත් ආයතනයෙන් හෝ ශත 50ක් ගෙවා මිළදී ගත හැකිය. තැපෑලෙන් අවශ්‍ය අයට රු. 1.35 ක මනි ඕඩරයක් හෝ පෝස්ටල් ඕඩරයක් විභාග කොමසාරිස් නමට එවීමෙන් ලබාගත හැකි ය.

5. අයදුම්පත්‍රයෙහි 14 වන කොටුවෙහි අයදුම්කරුගේ අත්සන සහතික කරවා ගැනීම පහත සඳහන් සුදුසුකම් ඇති අයෙකු ලවා කරවා ගත යුතුය.

ගුරුවරයකු/ගුරුවරියක වන අයදුම්කරු විසින් තමන් ඉගැන්වීම කරන පාසලේ ප්‍රධානයා ඉදිරියේ තම අත්සන තබා සහතික කරවා ගත යුතුය.

දැනට ගුරුවරයෙකු/ගුරුවරියක නොවන අයදුම්කරු විසින් තමන්ගේ අත්සන සාමදාන විනිශ්චය කාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරු කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, නාවුක, ගගන හෝ ගොඩ යුද්ධ හමුදාවක අධිකාර ලත් නිලධාරියෙකු, රු. 4,800ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ

ස්ථිර නිලධාරියෙකු හෝ ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කල පාසැලක ප්‍රධානයෙකු, හෝ එවැනි පාසැලක එම තත්ත්වයේ සිට විශ්‍රාම ලත් අයකු, කොට්ඨාශයේ ග්‍රාමසේවක තැන හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු ලවා හෝ සම්පූර්ණ කරවා ගත යුතුය.

නියමිත සුදුසුකම් ඇති අයකු විසින් තම අත්සන සහතික කරන ලද බවට අයදුම්කරු වගබලා ගත යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 ජනවාරි මස 8 දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේ දීය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**1973 මාර්තු—ඉංග්‍රීසි ගුරු විභාගය සඳහා අයදුම් පත්‍රය**

විභාගයට ඉල්ලුම් කරන කොටස :———. විභාග අංකය :———.
(මෙහි ඒ හෝ බී යන්න ලොකු අකුරින් ලියන්න) (කාර්යාලයේ ප්‍රයෝජනය සඳහායි)

1. අයදුම්කරුගේ පුරුදු අත්සන :———.
ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන වග :———.

2. අයදුම්කරුගේ සියලුම නම් සම්පූර්ණයෙන් :———.
(පූජකවරයෙක් හෝ මෙනෙවියක් හෝ මහත්මියක් හෝ නම් ඒ බව සඳහන් කරන්න. ගුරුවරයෙකු වශයෙන් පත්ව සිටි නම් පත්වීමේදී ව්‍යවහාර කළ නම ලිවිය යුතුය. එසේ නැතහොත් උප්පැන්න සහතිකයේ සඳහන් නම ලියන්න)

3. ලිපිනය—
(i) පෞද්ගලික :———.
(ii) සේවය කරන ස්ථානයෙහි ලිපිනය :———.

4. මධ්‍යස්ථානය (වඩා කැමති මධ්‍යස්ථානය පිළිවෙලින් ලියන්න)
(1) ———.
(2) ———.
(3) ———.
ස්ථාන තුන එකිනෙකට වෙනස් වීය යුතුය.)

5. විභාග ගාස්තු සඳහා අවශ්‍ය මුද්දර මෙහි අලවන්න. (ඉංග්‍රීසි ගුරු සහතික පත්‍ර විභාගයේ "ඒ" කොටස සඳහා රු. 25 යි. එම "බී" කොටස සඳහා රු. 20 යි).

| |
|---|
| **මුද්දර අලවන කොටුව** |
| **මේ මුද්දර අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කර සහතික කළ යුතුය. මුද්දර එක පිට එක නොසිටින සේ ඇලවිය යුතුය.** |

6. පුරවැසිභාවය—පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද, ලියාපදිංචි වීමෙන් නම් සහතික පත්‍ර අංක දිය යුතුයි :———.

7. (i) උපන් දිනය :———.
(ii) 1973 ජනවාරි මස 1 දිනට වයස : අවු :———, මාස:——— දින :———.

8. (i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය සමත් වූ— අවුරුද්ද :———. මාසය :———. විභාග අංකය :———.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වූ—අවුරුද්ද I :———, II ; මාසය I :———, II ;
විභාග අංකය I :———, II

(iii) ඉංග්‍රීසි භාෂාව "අ" නිර්දේශය සමත් වූ—
අවුරුද්ද :———, මාසය :———, විභාග අංකය :———

(iv) ඉංග්‍රීසි භාෂාව "ආ" නිර්දේශයන් සම්මාන සාමාර්ථයක් ලත් අවුරුද්ද :———, මාසය :———, විභාග අංකය : ———.

9. ඉංග්‍රීසි ගුරු සහතික පත්‍ර විභාගයේ "බී" කොටසට පෙනී සිටින්නේ නම් "ඒ" කොටස සමත් වූ—
අවුරුද්ද :———, මාසය :———, විභාග අංකය : ———.

10. ගුරුවරයාගේ ලියාපදිංචි කළ අංකය හෝ එම පත්වීම පිළිබඳ නිකුත් කරන ලද ලියමනේ අංකය හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් තැන හෝ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී තැන විසින් පත්වීම අනුමත කිරීම පිළිබඳ ලියමනේ හෝ විස්තර මෙහි සඳහන් කළ යුතුය :———.

11. තමන් සමත් වූ අන් කිසි විභාගයක් නිසා හෝ සේවය නිසා හෝ නිදහසක් ඉල්ලන්නේ නම් ඒ පිළිබඳ විස්තර: ———.
නිදහස ඉල්ලන්නේ කවර කොටසින් ද ? :———.

12. දැනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් සඳහා පමණි.
පාසලේ කළමනාකාර තැන විසින් හෝ මුල්ගුරු තැන විසින් හෝ මේ කොටස පිරවිය යුතුය :—

මෙම අයදුම්කරු පිළිබඳ ලිපි ලේඛනාදිය මා පරීක්ෂා කළ බවත් එම ලිපි ලේඛනාදිය අනුව මෙම අයදුම්පතෙහි 10 වැනි 11 වැනි කොටුවල ලියා ඇති කරුණු නිවැරදි බවත් සහතික කරමි.

පාසැලේ නම :———.
එහි පාලනය :———.

(ආණ්ඩුවේ පාසැලක් ද/අධ්‍යක්ෂ පාලිත පාසැලක් ද/අනුමත කළ ආධාර නොලබන පාසැලක් ද)

සහතික කරන අයගේ නම :———. අත්සන :———.
ලිපිනය : ———. දිනය :———.

13. අයදුම්කරුගේ සහතිකය :———.

මේ අයදුම් පතෙහි ලියන ලද කරුණු සැබෑ බවට මම සහතික කරමි. මෙහි අලවා තිබෙන මුද්දර මා විසින් ම ඇල වූ බවත්, ඒවා මීට ඉහතින් පාවිච්චි නොකළා වූ ද දැනට වලංගු වූ ද, හොඳ මුද්දර බවත් මෙයින් සහතික කරමි. තවද විභාග කොමසාරිස් විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට හා අයදුම් කරුවන් විසින් විභාග ශාලාවේ දී පිළිපැදිය යුතු අණපනත්වලටත් එකඟව ඉන් බැඳී සිටීමට ද මෙයින් පොරොන්දු වෙමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (සෑම අයදුම්කරුවකුම සඳහා) ——— වන මම ඉහත සඳහන් අයදුම්කරු ———පදිංචි වූ කෙනෙකු බවද, මා ඔහු/ඇ හොඳාකාර අඳුනන බව ද, 1972 ක් වූ ——— මස ——— වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ අත්සන :———.
තරාතිරම :———.
දිනය :———.
නම :———.
ලිපිනය :———.

ශ්‍රී ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

**විභාගාපේක්ෂකයන් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි. ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒබව නොපමාව විභාගශාලාධිපතින්ට දැන්විය යුතුය. විභාග ශාලාවේදී ඔබටම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිඳු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි ;

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි ;

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි ;

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි ;

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය ;

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රම යෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ ;

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න ;

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරනතුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය ;

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කතා කිරීම අවශ්‍ය වූ විටද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,<br>
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,<br>
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

1-953—73.01.26 දින අංක 44 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පලකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 සිකුරාද | 72.12.27 බදාද | දවල් 12.00 |
| | 73. 1.12 සිකුරාද | 73. 1. 3 බදාද | දවල් 12.00 |
| | 73. 1.19 සිකුරාද | 73. 1.10 බදාද | දවල් 12.00 |
| | 73. 1.26 සිකුරාද | 73. 1.17 බදාද | දවල් 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 සිකුරාද | 73. 1.24 බදාද | දවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාද | 73. 1 31 බදාද | දවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්ද | 73. 2. 7 බදාද | දවල් 12.00 |
| | 73. 2.23 සිකුරාද | 73. 2.14 බදාද | දවල් 12.00 |
| මාර්තු | 73. 3. 2 සිකුරාද | 73. 2.21 බදාද | දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද | 73. 2.28 බදාද | දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද | 73. 3. 7 බදාද | දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද | 73. 3.14 බදාද | දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද | 73. 3 21 බදාද | දවල් 12.00 |
| අප්‍රේල් | 73. 4. 4 සිකුරාද | 73. 3 28 බදාද | දවල් 12.00 |
| | 73. 4.11 බදාද | 73. 4. 4 බදාද | දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද | 73. 4.11 බදාද | දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද | 73. 4.18 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි